www.osilmo.com

# OSILMO Special Education & Research Center for Autistic Children







# කාරුණික උදාරතර හදවත් ඇති මිනිසුන්ට කෙරෙන ඇරයුමයි.......

**දහසකුත් මව්පියවරුන්ගේ සිත්වල ඇවිලෙන දුක්ගිනි**

**නිවා දමන්නට......**

**ඔවුන්ගේ හදවත්වලට සැනසුම් සුසුම් ගෙන එන්නට......**

**ගතවන හැම තත්පරයක්ම ලොවට නොපෙන්වා හඬා වැලපෙන.....**

**සිත් සතන් වලට.....**

**සිසිල් දිය දහරක් වන්නට......**

**වෙර දරන,..... පණ පොවන,..... මිනිසුන් වන්නෙමු.....**

**"ඔසිල්මෝ" අප.....**

ඔබ අප සැමගේම සියළුම ආගමික ශාස්තෘන් වහන්සේලා විසින් දේශනා කල පරිදි මනුෂ්‍යත්වය ලැබීම ඉතාමත් දුර්ලභ බව අප දනිමු.
එසේ නම් ඔබ අප ලැබු මෙම උත්තරීතර වූ මනුෂ්‍යත්වයෙන් ලෝකයට වැඩදායී සේවයක් කල හැකිනම්, එය අපගේ නාමය සදා අමරණීයත්වයට පත්කරනු ලබන නියත සත්‍යතාවයකි.



**කාරුණික ළයාන්විත හදවත් ඇති දයාබර මිනිසුනි;**

මදක් ඔබගේ දෙනෙත් විවර කර, හදවතින් අප වෙත සවන් යොමුකරලීමට කාලය එළඹ ඇත. සරණක් අවැසි සුන්දර දරුවන්ට, ඔවුන් හා ජීවිතය ගෙවන දෙමාපියන්ට සරණක් වීමට ඔබේ දෙඅත් දිගුකල හැක.

මේ එවන් වූ සරණක් සොයන සුන්දර මල් කැකුළුවන් දරුවන්ගේ
කඳුළු කතන්දරයයි.....

**සුන්දර වූ මල් කැකුළුවන් සමනළ පැටවුන්ගේ...**

**ළමා ලෝකය ගිල ගනිමින්.....**

**"ඔටිසම්" නම් රුදුරු මාරුතයට හසුව...**

**ගැලවීමට වෙරදරණ....**

**සුන්දර ළමා ජීවිත පිලිබඳව ඔබ දන්නෙහිද?......**

දරුවකු කුසතුල පිළිසිඳ ගත් දා පටන්, එම බිළිදා මෙලොව එළිය දකිනතුරු දෙමාපියන්ගේ හදවත්වලට දැනෙන හැඟීම් වචනයෙන් කිව නොහැක. එම බිළිදා මෙලොව බිහිවූ විට, එම සිඟිති මුවග දුටුවිට දෙමාපියන් ලබන සතුට මහමෙරක් මෙනි.

දින, සති, මාස, වසර ලෙසින් කාලයත් සමඟ දිනෙන් දින වැඩෙන දරුවා දෙස බලා ඔබ කෙතරම් අනාගත පවුරු බඳින්නේද?

නමුත් මේ සියළුම බලාපොරොත්තු හිරු දුටු පිනිබිඳු මෙන් වියැකී යන්නේ, කිසිවෙකු නොසිතනා පරිදිය.

තම දරුවා අන්දරුවන් මෙන් තමාදෙස නොබලනා විටත්, හුදකලාව තනිව ගතකරන විටත්, මුවඟින් සිඟිතිබස් තෙපලූ දරුවා මුව විවරකර කතාකිරීමට අමතක වූවා සේ සිටින විටදීත්, තම සිඟිති දරුවාගේ අසාමාන්‍ය හැසිරීම් රටාව සිතාගත නොහැකිව දරාගත නොහැකිව සිටින දෙමාපියන් දහසක් අප අතරම සිටින බව ඔබ අප මෙතෙක් නොදැන සිටියා වියහැක.

ළමා ලෝකය ගිල ගනිමින් "ඔටිසම්" වේගයෙන් ඉදිරියට ගමන් කරයි.

"ඔටිසම්" තත්වයට තම දරුවාට ලක්වී ඇතිබව දැනගත් විට මවකු, පියකු ලබන වේදනාත්මක, ඛේදනීය වූ තත්වය වචනයෙන් විස්තර කල නොහැක.
දෙඅත් හිසමත තබා ලෝකයම අමතක වූවාසේ, ඉකිගසා හඬා වැලපෙන පියවරුන්ට, මව්වරුන්ට "ඔසිල්මෝ" අප අත්වැල් බැදගනුයේ දයාබර වූ හදවතින් මෙන්ම ඉවසීම, දයාව, කරුණාව, මෛත්‍රිය මෙන්ම උත්සාහය, අධිෂ්ඨානය මිනිසත්කම ද මුල් කර ගනිමිනි.

"ඔටිසම්" සමග මහත්වූ අරගලයක යෙදී සුන්දරවූ ළමා ජීවිත අපට හැකි පමනින් ගලවා දී ඇති බැවින් "ඔසිල්මෝ" අපගේ සරණ ඔවුනට මහත් ශක්තියකි. ජීවිතයේ සුන්දරවූ කාලය සතුටින් ගත කිරීමට දෙමාපියන් වන ඔවුන්ට වරම් නොමැත. කුසට සැනසිල්ලේ අහරක් ගන්නට ඔවුනට නොහැක. උදෑසන අවදි වූ වේලාවේ පටන්ම දරුවා නින්දට යන තුරු සෑම තත්පරයක් පාසාම ලොවට නොපෙනී හඬා වැටෙන විට, සැබෑ ලෙසම ඔවුනට පිළිසරණක් වන්නේ කවුරුන්ද?

"ඔටිසම්" යනු කුමක්ද? යන්න දන්නේ ලෝකයෙන් කී දෙනෙකුද?

මෙලෙස මංමුලාවූ දෙමාපියන්ට "ඔසිල්මෝ" අප මහගු අත්වැලක් වන්නේ හදවතින්මය.

"ඔටිසම්" ජාති, ආගම්, කුල, භේද, නොසලකයි. දුප්පත්, පොහොසත්, උගත්, නූගත්කම් නොහඳුනයි. නමුත් සුන්දරවූ සිඟිති දරුවාගේ ජීවිතය පමණක් හඳුනයි.

අද මෙම දෙමාපියන් ලබන වේදනාකාරී පීඩාවන්ට, අනාගතයේදී ඔබට, අපට, මෙන්ම අපගේ දරුවන්ටද මුහුනදිය හැකිවන ඛේදනීය වූ තත්වයන්ට ලක්වීමේ අභියෝගයක් විය හැක.





"ඔසිල්මෝ" අප "ඔටිසම්" දරුවන්ගේ යෝධ සෙවනැල්ලයි. ජාති, ආගම්, කුලභේද මෙන්ම දුප්පත්, පොහොසත්, උගත්, නූගත් භේද "ඔසිල්මෝ" අප නොසලකන්නෙමු.

"ඔටිසම්" විසින් ගිලගත් සුන්දරවූ ළමා ලෝකය හැකි පමනින් නැවත ලබාදීමට පමනක් අප කැපවී සිටින්නෙමු.

"ඔසිල්මෝ" ආයතනය තුල චිකිත්සාවන් ලබන සියලුම දරුවනට "ඔසිල්මෝ" යනු දයාබර වූ මවෙකි, පියෙකි.



"ඔසිල්මෝ" අප විසින් සිදුකරනු ලබන මෙම උත්තරීතර වූ සේවය ලොවපුරා ද ඇයිමට ලක්කරවමින්, 2011 වසරේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මෙහෙයවූ **"නිහඬ සේවයේ යෙදෙන උදාර මිනිසා"** යන ස්වෙච්ජා සේවයේ යෙදෙන මිනිසුන් ඇගයීම උදෙසා සිදු කරනුලැබූ **"වී සම්මානය"** ශ්‍රී ලංකාවට ප්‍රථම වරට ලබාදීමට "ඔසිල්මෝ" වන අප භාග්‍යවන්තයෝ වුනෙමු.

මෙම උත්තරීතරවූ සම්මානය "ඔසිල්මෝ" අප ආයතනයට ලබාගැනීමට හැකිවූයේ, අප ආයතනයේ අධ්‍යක්ෂක වෛද්‍ය සින්නයියා දේවානන්දන් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයේ උදාරතරවූ කැපවීම මතය. මෙය අපගේ "ඔටිසම්" දරුවන්ගේ ලෝකයට මහත්වූ ආශිර්වාදයකි. මේනිසා "ඔටිසම්" දරුවන් පිලිබඳව ලෝකයම දැනුවත් කිරීමේ ප්‍රබලවූ දොරටුව අපට විවර විය.

අද වන විට ශ්‍රී ලංකාවේ දරුවන් පමණක් නොව, ආසියාතික, යුරෝපීය මෙන්ම ඇමරිකානු මෙන්ම කැනේඩියානු රටවල වෙසෙන දරුවන්ද "ඔසිල්මෝ" අපගේ චිකිත්සාවන්ට යොමුවී සිටී.

එබැවින් දිනෙන් දින වැඩිවන ඔටිසම් දරුවන්ට පිහිට වීමට **"ඔසිල්මෝ ඔටිසම් ගම්මානය"** කරා පියවර එසවීමට මෙම වසරේදී අප තීරණය කලෙමු .

එහි මූලික අදියරේ වැඩ කටයුතු මේවනවිට ඉතාමත් සාර්ථකව සිදුකෙරෙමින් පවතී.
අද "ඔටිසම්" දරුවා අනාගතයේදී වැඩිහිටියෙකි. කුඩා අවදියේදීම නිසි ප්‍රතිකාර ක්‍රම සිදු නොකලහොත්, මෙම දරුවා අනාගතයේදී ලෝකයට මහත් බරකි, පීඩාවකි. එසේනම්, අපගේ **"ඔසිල්මෝ ඔටිසම් ගම්මානය"** ලංකාවට පමනක් නොව ලෝකයේම සිටින "ඔටිසම්" දරුවන්ට අත්වැලක් වනු නොඅනුමානය.

ලොව වෙසෙන සාමාන්‍ය දරුවකු ලබන සියළුම අයිතිවාසිකම් "ඔටිසම්" දරුවාටද ලැබීමට අයිතියක් ඇත.

එම උදාරතර වූ අරමුණ ඔස්සේ, "ඔටිසම්" සමඟ අභියෝග කිරීමට "ඔසිල්මෝ" අප කිසිවිටකත් පසුබට නොවන්නෙමු.

කිසිදු ඖෂධ භාවිතයකින් තොරව, නිවැරදි චිකිත්සක ක්‍රමවේදයන් ඔස්සේ, අප මෙතෙක් සිදුකරනු ලැබූ පර්යේෂණයන් හා අත්දැකීම් වලට අනුව "ඔටිසම්" දරුවාට නිරන්තරයෙන් චිකිත්සක පරිසරයක් හිමිවිය යුතුය.

මේ වන විටත්, නේවාසිකව ප්‍රතිකාර ලැබූ සහ ලබන දරුවන් මෙන්ම, අප හා අත්වැල් බැදගත් දෙමපියන් ගේ දරුවන් ලබන ප්‍රගතිය අති මහත්ය.

"ඔටිසම්" ගැටලුවෙන් ගැලවී ජීවිතයෙහි සුන්දරත්වය විදින ලොව පුරා වෙසෙන "ඔසිල්මෝ" දූ දරුවන් අපට මහත්වූ ශක්තියකි. මේ පිලිබඳව අප පවසන්නේ "ඔසිල්මෝ" අපගේ පෞඩත්වය පිලිබඳව නැගෙන නිහතමානී වූ ආඩම්බරයෙනි.






ශ්‍රී ලංකාවේ පමනක් නොව ලොව පුරා වෙසෙන "ඔටිසම්" දූ පුතුන්ට **"ඔසිල්මෝ ඔටිසම් ගම්මානය"** තුලින්,

*** නේවාසික,**

*** අධ්‍යාපනික,**

*** බාහිර සහ අභ්‍යයන්තර ක්‍රීඩා මෙන්ම,**

*** සෞන්දර්ය සහ සමාජානුයෝගී පසුබිමක් තුල නිවැරදි චිකිත්සාවන් ලබාදීම අපගේ ඉලක්කයක් වේ.**

පියවරෙන්, පියවරට, අංගසම්පූර්ණව ඉදිකරනු ලබන මෙම උත්තරීතර වූ පුණ්‍ය භූමියට ඔබටද හැකි අයුරින් දායක විය හැක.

**අපට සහයෝගය ලබාදීමට දායක වන්නාවූ උත්තරීතර මිනිසුනි,**
අපගේ මෙම ව්‍යාපෘතියේ සියළුම දත්තයන් සහ තොරතුරු ඔබ වෙත ලබාදීමට අප කැපවී සිටින අතර, ඔබගේ උදාරතර වූ දායකත්වය කිසිදා නොමැකෙන ලෙස අපගේ **"ඔසිල්මෝ ඔටිසම් ගම්මානයේ"** සනිටුහන් වනු ඇත.
දිනක "ඔටිසම්" තුලින් ගැලවී සැබෑලොව දකින දරුවා නමස්කාර පූර්වකව ඔබගේ නාමයට කෘතගුණ සලකනු නොඅනුමානය.

**ඔබගේ කාරුණික හදවතින් සිතන්න......**

**ඔබගේ කාරුණික දෙනෙතින් දකින්න......**

**ඔබගේ කාරුණික මනුෂ්‍යත්වයෙන් අත දෙන්න......**

**මේ ඔබගෙන් ජීවිතය යදින්නේ ලෝකයට පා තැබූ.......**

**තවත් සුන්දර වූ දරුවෙකි......**





ඔබගේ උත්තරීතර වූ සත්කාරයන් සිදුකරලීමට,

**සියළුම විමසීම් / හමුවීම් පහත තොරතුරු ඔස්සේ සිදුකල හැක.**

**ලිපිනය:** අංක 182/5, කැස්බෑව පාර, බොරලැස්ගමුව.

**දුර කථන අංකයන්:** 0112545114 / 0714307274 / 0714204250

**වෙබ් අඩවිය:** www.osilmo.com

**ඊ මේල්:** osilmo@yahoo.com osilmo@outlook.com

osilmo@osilmo.com



# The signs of Autism














YOU CAN DO WHAT I CAN'T DO, I can do what you can't do,
Together we can do something, Beautiful for Autistic world.

-Dr.Sinniah Thevananthan



OSILMO

# SPECIAL EDUCATION & RESEARCH CENTER FOR AUTISTIC CHILDREN

OSILMO is the Life, Guidance and the World of your child

AUTISM